පෑළ දිග කෘෂි තොරතුරු සංගෘහිතය..

# Western Agri e - magazine

2 කලාපය 2025 ජූලි

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අන්තර්ජාල සඟරාව

## බස්නාහිර ආක්‍රමණිකයා පරදමු ......

1970 දශකය අවසානයේ සිට මහවැලි නිම්නය තුළ පැතිර යන ආක්‍රමණික ශාක විශේෂයක් වන යෝධ නිදිකුම්බා ශාකය මේ වන විට බස්නාහිර පළාත තුළ සීග්‍ර ලෙස පැතිරයමින් පවතී. උද්භිද විද්‍යාත්මකව *Mimosa pigra* ලෙස හැඳින්වෙන මෙම විශේෂය Fabaceae කුලයේ Mimosoideae උප කුලයට අයත් ශාකයකි. දකුණු ඇමරිකාව නිජබිම කරගත් මෙය මේ වන විට සර්මකලාපීය රටවල අධික වශයෙන් පැතිරීම නිසා ලොව ප්‍රධානතම ආක්‍රමණික ශාක 100 අතර ද ප්‍රමුඛස්ථානයක් ගනී.

## ශාකය පිළිබඳ විද්‍යාත්මක ලක්ෂණ....

වාර්ෂික වර්ෂාපතනය මි.මී 750 - 2500 අතර පරාසයක පැවතීම, මධ්‍ය උෂ්ණත්වය සෙ. අංශක 30 - 37 වැනි අගයක් තුල පැවතීම සහ විවිධ වයනයන් සහිත පස්වල ස්ථාවර වීමට ඇති හැකියාව නිසා මෙම ශාකයට විවිධ පාරිසරික තත්ත්වයන් යටතේ හොඳින් ස්ථාවර විය හැක. ඍජුව වැඩෙන මෙම ශාකය මීටර 06 - 07 පමණ උසකට වැඩෙන අතර නොමේරූ ළපටි කඳන් කොළ පැහැයෙන් ද මේරූ කඳ, කළු දුඹුරු පැහැයෙන් ද දක්නට ලැබේ. කඳේ සහ නොමේරූ කඳ කොටස්වල මි.මී 6-10 පමණ විශාල තියුණු කටු පිහිටයි. පත්‍ර, පත්‍රිකා රාශියකින් සමන්විත සංයුක්ත ඒකාක්ෂයක් වන අතර නිද්‍රා සන්නමන චලන පෙන්වයි.  මීටර් 3-4 පමණ ගැඹුරට  විහිදෙන මුදුන්  මුලක් සහිතව පුළුල්ව  විහිදුන  මූල පද්ධතියකින් සමන්විත යෝධ නිදිකුම්බා ශාකයට ගැඹුරට විහිදුන පසක මෙන්ම ඉතා තුනී පසක් සහිත ස්ථානවල ද හොඳින් වර්ධනය විය හැක. සංයුක්ත අනියත පුෂ්ප මංජරියක පිහිටි සාමාන්‍ය නිදිකුම්බා මලක හැඩය ගත් එක් පුෂ්පයක්, මි.මී 15-18 පමණ විශාලව දැකිය හැක. පරාගනයෙන් පසු කණ්ඩිකා 28-30 සහිත මි.මී 40-60 පමණ දිග කරල් 15-20 සහිත කරල් පොකුරක් හටගනී. එක් වරක දී ශාකයේ බීජ 2000 - 2800 වැනි විශාල ප්‍රමාණයක් ඇතිවේ. මෙම බීජවල කටු වැනි ප්‍රසරයන් දැකිය හැක. එමෙන්ම දැඩි බීජ කවචයක් පිහිටයි. මේ හේතුව නිසා ම යෝධ නිදිකුම්බා බීජ දිගු කාලයක් නොනැසී ජලය මත පාවෙමින් හෝ මිනිසුන්ගේ හෝ සතුන්ගේ ශරීරවල දැවටී ව්‍යාප්ත විය හැක. තව ද වසර 30 - 40 ක කාල තරණ හැකියාවක් ඇති බැවින් පස තුළ පවා දිගු කාලයක් නොනැසී පැවතී, හිතකර තත්ව ලැබුනු පසු හොඳින් ප්‍රරෝහණය වේ. ප්‍රරෝහණයෙන් පසු මාස 3-4 වැනි කෙටි කලකින් පරිණතවී බීජ නිපදවීමේ හැකියාවක් ඇති යෝධ නිදිකුම්බා ශාකයට ජීවිත කාලය තුළ දී ආසන්න වශයෙන් බීජ 20000-28000ක් පමණ නිපදවිය හැකි බව අධ්‍යයනය කර ඇත.



හොඳින් වර්ධනය වූ යෝධ නිදිකුම්බා ශාක



යෝධ නිදිකුම්බා ශාකයේ හොඳින් වර්ධනය වූ පත්‍ර

## බස්නාහිර පළාත තුළ යෝධ නිදිකුම්බා ශාකයේ ව්‍යාප්තිය...

මෙම යෝධ නිදිකුම්බා බස්නාහිර පළාත තුළ ව්‍යාප්තියට මූලිකව හේතු විය හැකි ආකාර කිහිපයක් හඳුනාගත හැක. ප්‍රධාන වශයෙන් මහවැලි ගඟ ආශ්‍රිතව ලබාගන්නා වැලි සහ සංවර්ධන කටයුතු සඳහා ප්‍රවාහණය කරනු ලබන පස් සමග මූලිකව පළාත තුළට මෙම ආක්‍රමණික ශාකය ඇතුල්වන්නට ඇතැයි අනුමාන කළ හැක. තව ද මෙම වැලි සහ පස් ප්‍රවාහනය කරනු ලබන මාර්ග දෙපස සහ අනවසරයෙන් ලබාගත් වැලි සහ පස් යොදාගත් පුද්ගලික ඉඩම් ආශ්‍රිතව ද මෙම යෝධ නිදිකුම්බා පැතිර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල, මාලඹේ වැනි ප්‍රදේශ වල පිහිටි තෙත් බිම් සහ කැළණි ගං මිටියාවත ආශ්‍රිතවත් ගම්පහ දිස්ත්‍රික්කය හරහා විහිදී ඇති මධ්‍යම අධිවේගී මාර්ග ඉදිකරන වැඩබිම් ආශ්‍රිතව හා එම වැඩබිම් සඳහා ප්‍රධාන සැපයුම් මාර්ග ලෙස භාවිත වන මහා මාර්ග ආශ්‍රිතවත් මෙම යෝධ නිදිකුම්බා ශාකය පවතින බව නිරීක්ෂණය වේ. මේ වනවිට ගම්පහ දිස්ත්‍රික්කයේ රාජ්‍යය හා පෞද්ගලික ඉඩම් ආශ්‍රිතව සහ සාරවත් වගා බිම් ද ආක්‍රමණය කරමින් පැතිර යන බව නිරීක්ෂණය කර ඇත. කඩවත සිට මීරිගම දක්වා ඉදිවන අධිවේගී මාර්ග පද්ධතියේ ඉදිකිරීම් බිම්වල සහ කොළඹ පිටත වටරවුම් මාර්ගය ආශ්‍රිතව වැඩි වශයෙන් පැතිර ඇති මෙම යෝධ නිදිකුම්බා ශාක මේ වන විට දිස්ත්‍රික්කය තුළ හෙක්ටයාර 28-30 ක පමණ ප්‍රදේශයක් පුරා දක්නට ලැබේ.

## යෝධ නිදිකුම්බා ශාකය මර්ධනය සඳහා දියත් කරමින් පවතින ක්‍රියාමාර්ග...

බස්නාහිර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ මගපෙන්වීම හා ගම්පහ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති අංශයේ මෙහෙයවීමෙන් මේ වන විට මෙම ආක්‍රමණික ශාක ව්‍යාප්තිය මර්ධනය කිරීම ආරම්භ කර ඇති අතර මේ වනවිට කෘෂිකාර්මික ඉඩම් ආශ්‍රිතව පැතිර ඇති වැඩුනු ශාක ගලවා ඉවත්කර නැවත පැළවන බීජ පැළ සහ කුඩා පැළ මර්ධනය සඳහා නිර්දේශිත ක්‍රම අනුගමනය කරනු ලැබේ. කෘෂිකර්ම උපදේශක කොට්ඨාශ මට්ටමින් තෝරාගත් ගොවි සංවිධාන මගින් වැඩසටහන් සංවිධානය කර වැඩුනු ශාක මූල පද්ධතිය සමග ගලවා ඉවත් කර පුළුස්සා දැමීමට කටයුතු කරන අතර දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමේ සම්බන්ධීකරණ කමිටු හා කෘෂිකර්ම කමිටු ප්‍රධානීන් සහ සම්බන්ධිත දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ගොවිජන සේවා මට්ටමින් ක්‍රියාත්මක ගොවි සංවිධාන, පාසැල් පරිසර කමිටු හා සෙසු පාසැල් දරු දැරියන් සහ වෙනත් ග්‍රාමීය ප්‍රජා සංවිධාන දැනුවත් කරමින් තවදුරටත් මෙම ශාක පැතිරයාම පාලනයට කටයුතු සම්පාදනය කර ඇත. දැනට හානිය පැතිර ඇති බවට හඳුනාගෙන ඇති පෞද්ගලික ඉඩම් හිමියන් දැනුවත් කර එම හිමිකරුවන් මගින් ශාක ගලවා ඉවත් කිරීම හා ඊට අවශ්‍ය මගපෙන්වීම තවදුරටත් සිදුකරමින් පවතින අතර මෙම වැඩසටහනට සමගාමීව කොළඹ නුවර අධිවේගී මාර්ග ඉදිකිරීම් සමාගම, ප්‍රාදේශීය සභාවන්, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ආදී සමගාමී රාජ්‍ය හා පෞද්ගලික ආයතන ද සහායක කණ්ඩායම් වශයෙන් සහභාගී කරගනිමින් විශාල ශාක ගලවා ඉවත්කර පුළුස්සා විනාශ කිරීමට කටයුතු කරමින් පවතී.

මෙම වැඩසටහන තවදුරටත් පුළුල් කර දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන මෙන්ම සෙසු මහජනතාව ද සම්බන්ධ කරගනිමින් මෙම හානිකර ස්වාභාවය තවදුරටත් පැතිරයාම පාලනය කිරීමට ගම්පහ දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති අංශය ඉදිරියේ දී කටයුතු යොදා ඇත. බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම කටයුතු අධීක්ෂණය සිදුකරමින් සිටින අතර මෙම ශාකය දැනටමත් දැඩි ආක්‍රමණික ශාකයක් ලෙස නම්කර තිබීමත්, ස්වාභාවයෙන්ම ඉතා කෙටි කලක් තුළ දී විශාල ප්‍රදේශයක් පුරා බීජ ව්‍යාප්ත කිරීමත්, දැනටමත් පිටස්තර ප්‍රදේශවලින් වැලි සහ පස් මෙම දිස්ත්‍රික්කය තුළට ප්‍රවාහනය කිරීමත් හේතුවෙන් මෙම ශාක ඉහත ප්‍රදේශ වලට අමතරව තව තවත් ප්‍රදේශ වල පැතිර යා හැකි බැවින් අත්‍යවශ්‍ය කටයුත්තක් සේ සලකා විශේෂිත කණ්ඩායම් ලෙස සංවිධානය වෙමින් තවදුරටත් මෙම ආක්‍රමණිකයා මර්දනයට පොදු මහජනතාව විසින් ද පියවර ගතයුතුවේ. එකී වගකීම් පැහැරහරින පුද්ගලයන් හෝ ආයතන හඳුනාගෙන සුදුසු පියවර ගැනීම හෝ නීතිමය වශයෙන් සිදුකළයුතු කටයුතු සිදු කිරීම සඳහා සුදුසුකම් ලත් නිළධාරී කණ්ඩායමක් මේ වනවිට පත්කර ඇත.



වර්ධනය වෙමින් පවතින යෝධ නිදිකුම්බා කරල්



හොඳින් පරිනත වූ යෝධ නිදිකුම්බා කරල්



යෝධ නිදිකුම්බා පුෂ්ප



හොඳින් වර්ධනය වූ ශාක කඳ කොටස්



බෙම්මුල්ල, නිට්ටඹුව හා මීරිගම කෘෂිකර්ම උපදේශක කොට්ඨාසවල ඩ්‍රෝන තාක්ෂණය භාවිතා කරමින් යෝධ නිදිකුම්බා ශාක පවතින ස්ථාන හඳුනාගැනීම



බෙම්මුල්ල, නිට්ටඹුව හා මීරිගම කෘෂිකර්ම උපදේශක කොට්ඨාසවල හඳුනාගත් ප්‍රදේශවල යෝධ නිදිකුම්බා ශාක පවතින ස්ථාන සිතියම්ගත කරන අයුරු

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සම්බන්ධ කරගනිමින් බස්නාහිර පළාතේ වගුරු බිම් හා අනෙකුත් ක්ෂේත්‍රයන්වල විශාල වශයෙන් ව්‍යාප්ත වෙමින් පවතින යෝධ නිදිකුම්බා ශාක ක්ෂේත්‍රයන් ඩ්‍රෝන යානා උපයෝගී කරගනිමින් සිතියම් ගත කිරීම හා එම ස්ථානයන් හඳුනාගෙන මර්දනය කිරීමේ කටයුතු මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී.



මීරිගම ප්‍රදේශයෙ අධිවේගී මාර්ගය දෙපස යෝධ නිදිකුම්බා ශාක විශාල ලෙස වර්ධනය වෙමින් පවතින අයුරු



බෙම්මුල්ල, නිට්ටඹුව හා මීරිගම කෘෂිකර්ම උපදේශක කොට්ඨාසවල හඳුනාගත් ස්ථානවල යෝධ නිදිකුම්බා ශාක බැකෝ රථ මගින් ගලවා විනාශ කිරීම

මෙම ශාකය මර්දනය සඳහා විවධ රටවල් මේ වනවිට අනුගමනය කරන පරිදි මෙම ශාකයට හෝ බීජවලට හානිකරන ජෛව පාලන ක්‍රමවේදයක් සොයා (*Neurostrota gunniella* - කඳ විදින පණුවන් - නයිජීරියාව, *Carmenta mimo* - ලපටි කොටස් ආහාරයට ගනී - මධ්‍යම ඇමරිකාව) කටයුතු කිරීමට අදාල පර්යේෂණ ආයතන සමබන්ධ කරගනිමින් කටයුතු සිදුකිරීම හැකිතාක් ඉක්මන් කළයුතු වේ. මීට අමතරව මෙම ශාකයේ බීජ ප්‍රරෝහණය වීම වලකන රසායනිකයන් පිළිබදව පර්යේෂණාත්මක අත්හදාබැලීමක් කළයුතු අතර බොහෝ රටවල සාර්ථක මර්දන ක්‍රමයක් ලෙස අනුගමනය කරන බිම ආවරණය කරන ශාක වගා කිරීම, මෙරට තුළ ද සාර්ථක මර්ධන ක්‍රමයක් වන බැවින් ඊට සුදුසු තත්වයේ ආවරණ බෝගයන් හඳුනාගෙන ඒවා හානිය අධික ප්‍රදේශවල ව්‍යප්ත කිරීමට කටයුතු කිරීම ද කළයුත්තකි.

දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක පරිසර සංවිධාන සහ පරිසරවේදීන්ගේ සහය ද මෙම වැඩසටහනට ලබාදෙමින් කටයුතු කිරීමේ දැඩි අවශතාවක් උදාවී ඇත. මක්නිසාදයත් ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිහිටි හරිතාගාරය බඳු මුතුරාජවෙල දක්වා මෙම ආක්‍රමණික ශාකයන් පැතිර යාම වලක්වා ගැනීම ඉතා ඉක්මනින් සිද්ධවිය යුත්තකි. එහි පවතින ගොඩබිම් තුළට මෙම ශාකයන් ඇතුල්වීම මගින් එහි ඇති ජෛව විවිධත්වයට දැඩි බලපෑමක් එල්ලකර ජීවත්වන සතුන්ට සහ කඩොලාන පරිසරයට ඇතිකරන බලපෑම විශාල හානියකට අත වනන්නකි. තව ද වගුරු බිමක් බැවින් සමහර ස්ථාන වෙත මිනිසුන්ට ලගාවීමට ඇති නොහැකියාව නිසා මෙම ශාක ගලවා ඉවත් කිරීමට නොහැකි වියහැක. එමෙන්ම සංවේදී පාරිසරික කලාපයක් බැවින් කෘෂි රසායනික භාවියට ගැනීමට හෝ ජෛව පාලකයෙකු එවැනි සංවේදී පරිසරයට හඳුන්වාදීමට නොහැකි වීමත් හේතුවෙන් මෙම ශාකය එම පරිසර පද්ධතිය තුළ ස්ථාවර වෙමින් දිගින් දිගටම ව්‍යාප්ත වීමට ඉහළ හැකියාවක් උදා කරගනී. ප්‍රධාන ජල වහන පද්ධතිය දෙපස මෙම ශාක වැඩීම නිසා ජල වහනය දිගින් දිගටම අවහිර වීමට හේතුවක් විය හැකි අතර මේ හේතුවෙන් ද ඉදිරියේදී විවිධ ගැටළු රාශියකට මුහුණ දීමට සිදුවීම ද නොඅනුමානය. මේ දක්වා ව්‍යාප්ත වී ඇති ප්‍රදේශවලින් මෙම ශාක ඉවත් කිරීමට ගතවන කාලය සැලකු විට තවදුරටත් ව්‍යප්ත වීමකින් ඉදිරියේ දී එම ශාක ඉවත් කිරීමට සිදුවීමකදී ඒ සඳහා යෙදවිය යුතු කාලය, මුදල හා ශ්‍රමය පිළිබඳවත් සලකා කටයුතු කළයුතු වේ. එබැවින් මේ වන විට පරිණත තත්වයේ තිබෙන ශාක හැකි ඉක්මනින් පරිසරයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඉදිරි වසර කිහිපයක් යනතෙක් නැවත නැවත ඇතිවන පැළ පරිණත වීමට පෙර පරිසරයෙන් ඉවත් කිරීමට සහය වෙමින් මෙම වැඩසටහන කෘෂිකර්ම අංශයේ වගකීමක් පමණක්ම නොව සැමගේ යුතුකමක් සහ වගකීමක් සේ සලකා කටයුතු කිරීම සමස්ත රාජ්‍ය සහ පෞද්ගලික අංශය ප්‍රමුඛ ජනතාවගේ කාර්යභාරයකි.



තාක්ෂණ දායකත්වය
කපිල දිසානායක
කෘෂිකර්ම උපදේශක, කෘ.උ. කාර්යාලය බෙම්මුල්ල.

මෙහෙයවීම හා අධීක්ෂණය
අයේෂා ගුණවර්ධන මිය
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ

සංස්කාරක මණ්ඩලය:
අයේෂා ගුණවර්ධන මිය, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ
පමිලා ද සිල්වා මිය, අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ
වයි.කේ. බමුණුආරච්චි මයා, නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (මූලස්ථාන)
ගීතානි ස්වර්ණලතා මිය, සහකාර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (ප්‍රගති)
බී.ඒ.බී. ලක්මිණි මිය, සහකාර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන)

පරිගණක පිටු සැකසීම
සී.එන්.අයි. දිල්හාන් මයා
කෘෂිකර්ම උපදේශක